**ශීර්ෂය 216 - සමාජ සේවා දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය**

---

ශීර්ෂය 216 - සමාජ සේවා දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2016 සැප්තැම්බර් 05 දින දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂයපථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වාගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

---

**2.1 විසර්ජන ගිණුම**

---

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

---

දෙපාර්තමේන්තුව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 604.53 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු. මිලියන 548.03 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු. මිලියන 56.50 ක් හෙවත් සියයට 9.35 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2015 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | **ශුද්ධ ප්‍රතිපාදනය** | **උපයෝජනය** | **ඉතිරිය** | |
| | **රු. මිලියන** | **රු. මිලියන** | **රු. මිලියන** | |
| පුනරාවර්තන | 426.66 | 407.12 | 19.54 | 4.58 |
| මූලධන | 177.87 | 140.91 | 36.96 | 20.78 |
| **එකතුව** | **604.53** | **548.03** | **56.50** | **9.35** |

**2.2 අත්තිකාරම් ගිණුම**

**2.2.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දෙපාර්තමේන්තුවට අදාළ විෂය අංක 21601 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ .

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| 16.39 | 15.49 | 11.50 | 14.32 | 75.00 | 52.70 |

**2.3 අග්‍රිම ගිණුම**

දෙපාර්තමේන්තුව යටතේ වූ අංක 7002/0000/00/0105/0015/000 දරන අග්‍රිම ගිණුමේ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය රු. 626,762 ක් විය.

**2.4. පොදු තැන්පත් ගිණුම්**

දෙපාර්තමේන්තුව යටතේ වන තැන්පත් ගිණුම් 04 ක 2015 දෙසැම්බර් 31 දිනට ශේෂවල එකතුව රු. 217,100 ක් විය. විස්තර පහත දැක්වේ.

| තැන්පත් ගිණුම් අංකය | 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|
| | රු. |
| 6000/0000/00/0001/0052/000 | 175,000 |
| 6000/0000/00/0002/0069/000 | 22,000 |
| 6000/0000/00/0013/0038/000 | 20,000 |
| 6000/0000/00/0018/0052/000 | 100 |
| **එකතුව** | **217,100** |

## 2.5 විගණන නිරීක්ෂණය

සමාජසේවා දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

## 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

### 3.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

විෂය අංක 21601 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2015 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව 2015 දෙසැම්බර් 31 දිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු. 2,709,846ක් වූ අතර, එම හිඟහිටි ණය ශේෂ වර්ෂ 01 ක සිට වර්ෂ 21 ක් දක්වා කාල පරාසයක සිට පැවත එමින් තිබුණත්, එම හිඟහිටි ණය ශේෂ සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අයකර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

### 3.2 අනුකූල නොවීම්

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|---|
| | | රු. | |
| | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| (අ) | මුදල් රෙගුලාසි 94(1) | 407,677 | වාර්ෂික ඇස්තමේන්තු වල ප්‍රතිපාදන ඉක්මවා වගකීම් සඳහා බැදීම් ඇති කර නොගත යුතු වුවද ඊට අනුකූලව කටයුතු කර නොතිබුණි. |
| (ආ) | මුදල් රෙගුලාසි 752 (2) | - | දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ හා වෘත්තිය පුහුණු ආයතන 08 ක ට අදාලව භාණ්ඩ සමීක්ෂණ වාර්තාවලින් අනාවරණය කර තිබුණු අතිරික්ත සහ ඌනතා සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |

**3.3 දේශීය මූල්‍යකරණ මගින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම**

-----------------------------------------------------

නියැදි පරීක්ෂණවලදී පහත සඳහන් ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන් අනාවරණය විය.

**ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්**

**----------------------------------**

දෙපාර්තමේන්තුව විසින් පහත සඳහන් ව්‍යාපෘති 2015 දෙසැම්බර් 31 දින වන විටත් ඉටුකර නොතිබුණු බව නිරීක්ෂණය විය.

| ව්‍යාපෘතිය | ඇස්තමේන්තු ගත පිරිවැය | ආරම්භ කළ දිනය | 2015 දෙසැම්බර් 31 දින වනවිට වියදම | ප්‍රමාදයට හේතු |
| --- | --- | --- | --- | --- |
| | රු. | | රු. | |
| ජයවිරු සෙවන ආයතනය | 13,000,000 | 2014.02.01 | 7,409,966 | බිල්පත් ඉදිරිපත් නොකිරීම |
| අමුණු කුඹුර ආයතනය | 467,314 | 2015.02.09 | 467,314 | බිල්පත් ඉදිරිපත් නොකිරීම |

**3.4 කාර්යසාධනය**

**-----------------**

2015 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරී සැලැස්ම අනුව දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

**(අ) ප්‍රමාණවත් ලෙස ඉටුනොකළ ප්‍රධාන කාර්යයන්**

**--------------------------------------------------**

දෙපාර්තමේන්තුව විසින් ඉටුකළ යුතු ප්‍රධාන කාර්යයන් ප්‍රමාණවත් ලෙස ඉටු කර නොතිබුණු අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(i) රාජ්‍ය නොවන ආයතන 09 කට රු.2,165,000 ක මූල්‍යාධාර සැපයීමට සැලැසුම් කර තිබුණද, ඉන් ආයතනයකට පමණක් රු.100,000 ක මූල්‍යාධාර ලබා දී තිබුණි. ආයතන 8 කට මුදල් ආධාර ලබා දී නොතිබුණි.

(ii) පෙර පාසල් 05 කට රු.450,000 ක මූල්‍ය ආධාර සැපයීමට සැලැසුම් කර තිබුණද, පෙර පාසල් 03 කට පමණක් රු.240,000 ක මූල්‍ය ආධාර ලබාදී තිබුණි. මූල්‍ය ආධාර ලබානොදුන් පාසල් සංඛ්‍යාව 2 ක් විය.

(iii) අධීක්ෂණ හා මෙහෙයුම් අවස්ථා 20 ක් සැලැසුම් කර තිබුණද, කිසිදු අධීක්ෂණ හෝ මෙහෙයුම් කටයුත්තක් සිදු කර නොතිබුණි.

**(ආ) සැලැසුම් කිරීම**

-----------------

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්ම අනුව කටයුතු ඉටු නොකළ අවස්ථා නිරීක්ෂණය විය.

(i) මුළු දිවයිනටම අමතර ක්‍රියාකාරකම් සංවර්ධනය සඳහා (ක්‍රීඩා, ශිල්ප, කලා) රු.3,436,000 ක ප්‍රතිපාදන සලසා තිබුණද, එය ක්‍රියාත්මක නොකිරීම මත මුළු ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

(ii) විශේෂ අවශ්‍යතා ඇති දරුවන් සඳහා රත්නපුර පිහිටවූ මධ්‍යස්ථානයට ක්‍රියාකාරී සැලැස්ම මඟින් රු.1,070,000 ක ප්‍රතිපාදන සලසා තිබුණද, ඉන් රු.352,000 ක් වැය කළ පසු ඉතිරිය සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 67 ක් වී තිබුණි.

(iii) ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම සඳහා රු.2,500,000 ක ප්‍රතිපාදන සලසා තිබුණද, ඒ සඳහා රු.29,000 ක් පමණක් වැය කර තිබුණි. ඉතිරිය සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 98.84 ක් විය.

(iv) අධීක්ෂණ හා මෙහෙයුම් අවස්ථා 20 ක් සඳහා රු.2,500,000 ක ප්‍රතිපාදන සලසා තිබුණද, එක් අවස්ථාවක් හෝ නොපැවැත්වීම හේතුවෙන් මුළු ප්‍රතිපාදනයම ඉතිරි කර තිබුණි.

(v) 2015 වර්ෂයේ සංශෝධිත ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් පරිදි ස්වේච්ඡා කණ්ඩායම් පුහුණු කිරීමේ වැඩසටහන් 331 ක් සැලැසුම් කර තිබුණද, ඉන් වැඩසටහන් 123 ක් පවත්වා නොතිබුණි.

(vi) ප්‍රජා නායකයින් පුහුණු කිරීමේ වැඩසටහන් 331 ක් හා සංඥා භාෂා වැඩමුලු 14 ක් පැවැත්වීමට සැලැසුම් කර තිබුණද, පිළිවෙලින් වැඩසටහන් 93 සහ වැඩමුළු 6 ක් පමණක් පවත්වා තිබුණි.

(vii) ප්‍රජා මූලික පුනරුත්තාපන වැඩ සටහන යටතේ ප්‍රජා මූලික පුනරුත්තාපන අත්පොත් මුද්‍රණය සහ ඊට අදාළ වන අනෙකුත් වාර්තා මුද්‍රණයට රු.700,000 ක ප්‍රතිපාදන සලසා තිබු නමුත්, අදාළ අත්පොත් කිසිවක් මුද්‍රණය කර නොතිබුණි.

(viii) ප්‍රජා මූලික පුනරුත්ථාපන වැඩසටහනේ 25 වැනි වාර්ෂික උත්සවය මුළු දිවයින පුරාම පැවැත්වීමට රු.මිලියන 2 ක ප්‍රතිපාදන සලසා තිබුණද, එම වැඩසටහන සමාලෝචිත වර්ෂයේ පවත්වා නොතිබුණි.

## 3.5 මානව සම්පත් කළමනාකරණය

---------------------------------

**(අ) අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

---------------------------------------------------------

2015 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 11 | 09 | 02 |
| (ii) | තෘතියික මට්ටම | 124 | 120 | 04 |
| (iii) | ද්විතියික මට්ටම | 515 | 482 | 33 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 97 | 95 | 02 |
| (v) | වෙනත් | 18 | 11 | 07 |
| | **එකතුව** | **765** | **717** | **48** |

**(ආ) අවිධිමත් ලෙස වෙනත් පාර්ශවයන්ට නිදහස් කළ මානව සම්පත්**

----------------------------------------------------------------------

දෙපාර්තමේන්තුවේ නිලධාරීන් 03 දෙනෙකු සමාලෝචිත වර්ෂයේදී රේඛීය අමාත්‍යාංශය වෙත මුදාහැර තිබුණි.